

24

# මුහම්මද් ﷺ තුමාගේ දඃවා හා අභියෝග

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට පහළ වූ ප්‍රථම වහී තිගැස්මක් ගෙන දුන්නේ ය. එතුමා ඒ පිළිබඳව පැහැදීමට පත් වුව ද එම තත්ත්වයෙන් පූර්ණ වශයෙන් මිදුණේ නැත. එම අවස්ථාවේ දී ''**පොරොවා ගෙන වැතිර සිටින නබිවරයාණෙනි! නුඹ නැගිට (මිනිසුන්ට) අනතුරු අඟවනු.**'' (74:12) යන වැකිය මඟින් ජනතාවට ඉස්ලාමය ප්‍රචාරය (දඃවා) කරන මෙන් අල්ලාහ් අණ කළේ ය.

මෙය පිළිගත් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ ප්‍රථමයෙන් ම තම පවුලේ උදවියට හා මිතුරන්ට එය ප්‍රචාරය කළහ. පසුව තම ගෝත්‍රිකයන් සංග්‍රහයකට කැඳවා ඉස්ලාමය ගෙන හැර දක්වා තමන්ට සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටියහ. තව ද සෆා කඳු මුදුනට නැග හඬ නගා පොදු ජනතාව කැඳවා තම දේව පණිවිඩය දේශනා කළහ.
නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා දේශනා කළ දේව පණිවිඩය හා ඒකත්වයේ පණිවිඩය කුරෙයිෂිවරුන්ට ආශ්චර්යජනක වූ අතර නීරස ද විය. එය තම නැමදුම් වතාවත්වලට සහමුලින් ම පටහැනි බවත් තම බලය අහිමි කරවන බවත් ඔවුහු සිතූහ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මුල් වසර 3 ඇතුළත රහසිගත ව තම දේව පණිවිඩය ප්‍රචාරය කළහ. එවකට පවුලේ කිහිප දෙනෙක් ද මිතුරන් කිහිප දෙනෙක් ද සමාජය තුළ යහපත් පුරවැසියන් ලෙස සිටි කිහිපදෙනෙක් ද "හනීෆ්" නැමැත්තන් කිහිප දෙනෙක් හා වහලුන් කිහිප දෙනෙක් ද ඉස්ලාමය වැළඳ ගත්හ. ඔවුන්ට අවශ්‍ය පුහුණුවීම් ද ඉගැන්වීම් ද සෆා කඳු පාමුල පිහිටි දරුල් අර්කම් නැමැති නිවසේ දී ලබා දෙන ලදි.

ඉන් පසුව ප්‍රසිද්ධියේ ප්‍රචාරක කටයුතුවල නියැලුණු විට අභියෝග රැසකට මුහුණ දීමට එතුමාට සිදුවිය. අබූලහබ්, අබූජහ්ල් යන අයගේ නායකත්වය යටතේ විරෝධතා එල්ල විය. පිස්සා, හූනියම්කරුවා, කවියා යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට ඔවුහු නම් පට බැන්දෝ ය. ඔවුහු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සමඟ එක් නොවන ලෙස පොදු ජනතාවට අවවාද කළහ.

නමුත් අල්ලාහ්ගේ සැලැස්මට අනුව ඉස්ලාම් ක්‍රමක්‍රමයෙන් වර්ධනය විය. විරුද්ධවාදීහු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පිය නඟන මංමාවත්වල කටු ඇහිරූහ; ගෙල රෙදිවලින් සිර කළහ; ඔටුවන්ගේ නරක් වූ බඩවැල්, මාලයක් ලෙස කරේ දැමූහ; පහර දී තුවාල සිදු කළහ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අනුගමනය කරන්නන්ට හිරිහැර කරන ලදී. එලෙස ඉස්ලාමය වැළඳගත්තවුන්ට පවුලේ උදවිය නින්දා කළහ. තවද ඉස්ලාමය වැළඳගත් වහලුන් කෲර ලෙස හිංසනයට ලක් කළහ. නමුත් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ද, එතුමාගේ යහළුවෝ ද නොසැලී සිටියහ.

මුෂ්රික්වරුන්ගේ පහරදීම් දිනෙන් දින වැඩි වූ විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මුස්ලිම්වරුන් කිහිප දෙනෙකු හබෂාවට යැවූහ. නුබුව්වත් පහේ දී 15 දෙනෙක් ද, නුබුව්වත් හතේ දී 100 දෙනෙක් ද කණ්ඩායම් දෙකක් ලෙස පිටවූහ. එහෙත් ඔවුන්ට හිරිහැර කිරීම කාෆිර්වරු අත් නොහැරියෝ ය. ඔවුන් නැවත හබෂාවේ සිට ගෙන්වා ගැනීමට කාෆිර්වරු උපක්‍රම රැසක් උපයෝගී කර ගත්හ. නමුත් ඒවා සියල්ල ම පරාජයට පත් විය. හබෂාවේ සිටි අවංක රාජ්‍ය පාලකයෙකු වූ නජ්ජාසි, මුස්ලිම්වරුන්ට රැකවරණය සැපයුවේ ය. නමුත් මක්කාවේ කුරෛයිෂිවරුන්ගේ බියගැන්වීම අවසන් නොවී ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ආරක්‍ෂා කිරීමෙහි ලා එතුමාගේ මහප්පා වූ අබූතාලිබ් විශාල මෙහෙයක් සිදු කළේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ප්‍රචාරය තහනම් කරන ලෙස ඉල්ලූ කුරෛයිෂිවරුන්ගේ ඉල්ලීම් ඔහු ප්‍රතික්ෂේප කළේ ය. රාජ්‍ය පාලනය, ස්ත්‍රීන්, රත්තරන් යනාදියට ආශාව ඇති කර නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ගමන් මඟ වෙනස් කිරීමට ඔවුහු උත්සාහ කළහ. දෙපාර්ශ්වයේ ම නැමදුම් වතාවත්හි ෂිර්ක් හා තව්හීද් අතර සමානතාවක් දැකීමට උත්සාහ කළහ. මේ කිසි ඳු දෙයකින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පීඩාවට පත් නොවී ය. එමෙන් ම අංගු මාත්‍රයකින්වත් එකඟ වූයේ ද නැත.

කුරෙයිෂිවරු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ප්‍රචාරය වළක්වන්නට තවත් උපක්‍රමයක් ලෙස එතුමාගේ ගෝත්‍රිකයන් සමාජයෙන් කොන් කළහ. මේ පිළිබඳ ව දැන්වීමක් කෑබාවේ එල්ලා තබන ලදි. **ෂිඃබු අබීතාලිබ්** නම් නිම්නයේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පවුලේ සාමාජිකයන් අවුරුදු තුනක් තහංචියක් පැනවූහ. දරුවන් කුසගින්න දරා ගත නොහැකි ව හඬ නගා හැඬුවෝ ය. යහපත් පුරවැසියන්ට එය ඉවසා ගත නොහැකි ව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පවුලේ සාමාජිකයන්ට රහසේ උදවු උපකාර කළහ. එලෙස උදවු කරන්නන් හසු කර ගත් විට ඔවුනට දඬුවම් කරන ලදි. එවිට සානුකම්පිත තරුණයින් කිහිප දෙනෙකු මෙයට තීන්දුවක් ගත යුතු යැයි, තීරණය කර කෑබාවේ එල්ලා දමා තිබූ දැන්වීම ඉරා දැමූවෝ ය. අනතුරුව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට සහ අන් අයට ද නිදහස ලැබුණි.

එලෙස නිදහස ලබා නොබෝ දිනකින් තවත් කම්පනයක් ඇති විය. මෙතෙක් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාට ශක්තියක් වී සිටි අබූතාලිෆ් තුමා ද කදීජා රළියල්ලාහු අන්හා තුමිය ද මිය ගියහ. එම නිසා එම වසර **"ආමුල් හුස්න්"** යනුවෙන් හඳුන්වනු ලබයි. මෙය කුරෙයිෂිවරුන්ට හොඳ අවස්ථාවක් විය. කුරෙයිෂිවරු පෙරටත් වඩා දරුණු ලෙස හිරිහැර සිදු කළහ. ඉන් වේදනාවට පත් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මක්කාවෙන් පිට වී තායිෆ් නගරයට ගියහ. එහි දී තමන් අල්ලාහ්ගේ දේව ධර්ම දූතයා යැයි හඳුන්වා දුන්හ. නමුත්, ඔවුහු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සමච්චලයට ලක් කළහ. එතුමාට ගල්මුල්වලින් පහර දුන්හ. මේ අවස්ථාවේ දී පවා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එම ජනයා දඬුවමට ලක් නොකර ඔවුන්ගේ යහපත උදෙසා ප්‍රාර්ථනා කළහ. වෙනත් මඟක් නොමැති කල්හි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "මුත්ඉම්" නැමැත්තාගේ රැකවරණයේ ජීවත් වූහ.

මේ කාලය අතරතුර දී බලාපොරොත්තු නොවූ පරිදි යත්රිබ් නගරයේ සිට පැමිණි යාත්‍රිකයින් කිහිප දෙනෙක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අකබාවෙහි හමු වූහ. ඔවුන්ට එතුමා තමන් "අල්ලාහ්ගේ ධර්ම දූතයා" යැයි හඳුන්වා දෙනු ලැබී ය. ඔවුහු මීට පෙර අවසාන නබි පිළිබඳ පුවත යුදෙව්වන් මඟින් දැන සිටි හෙයින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පිළිගත්හ. ඔවුහු යත්රිබ් නගරයට ගොස් මෙම සුබ පුවත ව්‍යාප්ත කළෝ ය. ඉන්පසු ඊළඟ වසරේ 12 දෙනෙක් ද පසුව 72 දෙනෙක් ද මක්කාවට පැමිණ ඉස්ලාමය වැළඳගත් අතර 'අකබා' නම් ස්ථානයෙහි දිව්රුම් දුන්හ. මෙහි දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා හා මදීනා වාසීන් අතර කොන්දේසි කිහිපයක් සහිත ගිවිසුමක් ඇති කර ගැණිනි. මෙය **"අකබා ගිවිසුම"** යනුවෙන් හඳුන්වනු ලැබේ.

මෙම අවස්ථාවේ දී මදීනා වැසියෝ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට මදීනාවට එන ලෙස ආරාධනා කළහ.

මදීනා වැසියන්ගේ ආරාධනාවට අනුව නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා මක්කා මුස්ලිම්වරුන් කිහිපදෙනෙකු මදීනාවට යැවුවේ ය. ඉන්පසු එතුමා ද එහි යාමට සූදානම් විය. මෙම ගමන හිජ්රත් යැයි හඳුන්වනු ලැබේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මදීනාවට ගිය හොත් එය තමන්ගේ ආධිපත්‍යයට හා ගෞරවයට අනතුරක් යැයි සිතූ කුරෙයිෂිවරු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඝාතනය කිරීමට තීරණය කළහ.



නමුත් නිරුපද්‍රිතව නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මදීනා නුවරට සේන්දු වූහ. මෙතුමාගේ මෙම ගමන **"හිජ්රත්"** යනුවෙන් හඳුන්වනු ලැබේ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් යත්රිබ් නගරයට ප්‍රවේශ වීමත් සමඟ එම නගරය "මදීනතුන් නබි" යැයි නම් කරනු ලැබිණි. මදීනාවට ගිය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට ද මුස්ලිම්වරුන්ට කුරෛෂිවරු ද නිදහසේ ජීවත් වීමට ඉඩ නොදුන්හ. මදීනාවේ වාසය කළ යුදෙව්වන් එතුමාට විරුද්ධ ව උසි ගැන්වූවෝ ය; මදීනාවේ සිට පැමිණි වන්දනාකරුවන්හට තර්ජනය කළහ; මදීනා සීමාවේ සිට පහර එල්ල කළහ. අවසානයේ දී මුස්ලිම්වරුන් කිසිදු සූදනමක් නොමැති ව සිටින විට යුද වැදීමට සේනාවක් එවූහ. එවිට මුහුණට මුහුණ ලා සටන් වැදීමට මුස්ලිම්වරුන්ට සිදු විය.

මුස්ලිම්වරු හා මුෂ්රික්වරු අතර බද්ර්, උහද්, අහ්සාබ් යනාදි වශයෙන් සටන් රැසක් සිදු විය. ඉන් කුරෙයිෂිවරු පැරදුණහ. මේ නිසා මුස්ලිම්වරු තවදුරටත් ශක්තිමත් වූහ. හිජ්රි වසර 6 දී "හුදෙයිබියා" නම් ස්ථානයේ දී දෙපාර්ශ්වය අතර සාම ගිවිසුමක් ඇති කර ගන්නා ලදි. මක්කා කුරෙයිෂි වැසියෝ දෙවසරක් ඇතුළත එම ගිවිසුම උල්ලංඝනය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම්වරුන් විසින් මක්කාව ජය ගෙන එහි ඉස්ලාම් ස්ථාපිත කරන ලදි.

මේ කාලය අතරතුර දී ඉස්ලාමීය දේව පණිවිඩය ලොව පුරා පතුරුවා ලීමේ සේවාව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා විසින් ම ආරම්භ කරන ලදි. අරාබි දේශයෙන් පිටතට ඉස්ලාම් ව්‍යාප්ත වීමට මඟ පාදන ලදි.

මෙලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මක්කා, මදීනා යන ප්‍රදේශ දෙකෙහි ම අභියෝග රැසකට මුහුණ දී අල්ලාහ්ගේ උපකාරයෙන් ඉවසීමෙන් හා සුදුසු ක්‍රියාමාර්ග තුළින් ජය ගෙන අල්ලාහ්ගේ පණිවිඩය දේශනා කර ජය ලැබූහ.

### පාඩමෙහි අන්තර්ගත අරාබි වචන

الصَّفَا حَنِيْفٌ قُرَيْشٌ عَامُ الحُزْنِ بَيْعَةُ الْعَقَبَةِ شِعْبُ أَبِيْ طَالِب الحَبَشَةُ النَّجّاشِي

الأَحْزَابُ الْحُدَيْبِيَّة يَثْرِبُ شِرْكٌ تَوْحِيْدٌ

### අභ්‍යාස

1. මුස්ලිම්වරුන් හිජ්රත් ගිය නගර මොනවා ද?

2. මුස්ලිම්වරුන් හා කුරෙයිෂිවරුන් අතර සිදු වූ සටන් 3ක් සඳහන් කරන්න.

3. රහසිගත ප්‍රචාරයේ දී ඉස්ලාමය වැළඳ ගත් අය කවරහු ද?

4. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා දෑවා දෙසට පෙළඹවූ අල් කුර්ආන් වැකිය කුමක් ද?

5. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ දෑවාවට කුරෛෂිවරුන් විරුද්ධ වීමට හේතුව කුමක් ද?

6. ප්‍රසිද්ධ ප්‍රචාරය වළක්වාලීමට කුරෛෂිවරු කුමන ක්‍රියාවන් අනුගමනය කළෝ ද?

7. "ආමුල් හුස්න්" යනු කුමක් ද? එය එසේ පැවසීමට හේතුව කුමක් ද?

8. කෙටියෙන් පහදන්න.

- ෂිඃබු අබූතාලිබ්
- බයිඅතුල් අකබා
- හිජ්රත්
- මදීනතුන් නබි